# 4 ශ්‍රේණිය පරිසරය වැඩපොත - අංක 16
## ( පිළිතුරු සහිතයි )

## (2020 නව නිර්දේශය 16 - අපේ අතීත විත්ති )




**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
(Dip. In Sci. N.I.E./O.U.S.L.)


{16 ඒකකය - අපේ අතීත විත්ති : විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශය ආවරණය වන පරිදි සකස් කර ඇත. }

# 16. තේමාව-අපේ අතීත විත්ති

අපේ අතීතය පිළිබඳ අවබෝධයක් තිබීම අනාගතය ගොඩ නංවා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වෙයි. එම නිසා කුඩා කාලයේ සිට ම සිසුන්ට අපගේ අතීතය පිළිබඳ තොරතුරු ක්‍රමානුකූල ලෙස අධ්‍යයනය කිරීමටත් අගය කළ යුතු දෑ අගය කිරීමටත් මඟ පෙන්විය යුතු ය. මෙම තේමාව යටතේ තමා ඉගෙන ගන්නා පාසලත්, අවට පරිසරයත් ඇසුරු කර ගෙන අතීත තොරතුරු හැදෑරීමටත් අගය කළ යුතු දෑ හඳුනා ගෙන අගය කිරීමටත් සිසුන් යොමු කිරීම අපේක්ෂා කෙරේ. එසේ ම සිසුන්ගේ හැකියා මට්ටමට අනුව නිරීක්ෂණය, ගවේෂණය වැනි ක්‍රම මඟින් තොරතුරු හඳුනා ගැනීමට හා සුදුසු පරිදි වාර්තා කිරීමට යොමු කිරීමත් ගැමි ක්‍රීඩාවක් වන ඔලිඳ කෙළිය පිළිබඳ අවබෝධයක් ලබා දීමත් මෙහි දී අපේක්ෂා කෙරේ.

➢ **ඉගෙනුම් පල**

- ඓතිහාසික වටිනාකමකින් යුතු ස්ථාන හඳුනා ගනියි. ඒවායේ ඇති වටිනාකම අවබෝධ කර ගනිමින් අගය කරයි.
- තම ප්‍රදේශයේ හෝ ආසන්න ප්‍රදේශයේ හෝ ඓතිහාසික වටිනාකමක් ඇති ස්ථානවල හා ශාකවල ඇති වැදගත්කම විමර්ශනය කරයි.
- රටේ කීර්ති නාමය නැංවීමට දායකත්වය දැක්වූ චරිත අධ්‍යයනය කර වාර්තා කරයි.
- අතීත කලා මෝස්තර රටා ඇසුරෙන් නිර්මාණ කරයි.
- අතීතයේ සිට පැවති ගෘහස්ථ ක්‍රීඩාවල යෙදෙමින් විනෝද වෙයි.
- රටට මෙහෙයක් සිදු කළ මුතුන්මිත්තන්ගේ ආදර්ශවත් චරිත නිරූපණය කර පෙන්වයි.

**01) ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධියට පත් ඓතිහාසික ස්ථාන කිහිපයක පින්තූර පහත දැක්වේ. වැඩිහිටියන්ගේ උදව් ඇතිව ඒවා හඳුනා ගෙන නම් කරන්න.**






**1**.................................. **2**................................. **3**................................. **4**.................................






**5**.................................. **6**................................. **7**................................. **8**.................................






**9**.................................. **10**............................... **11**............................... **12**...............................

**13**.................................. **14**................................. **15**................................. **16**..................................

**17**..................................**18**................................. **19**................................. **20**..................................

**21**................................. **22**................................. **23**................................. **24**..................................

**25**................................. **26**................................. **27**................................. **28**..................................

**02) මෙවැනි ඓතිහාසික වැදගත්කමක් ඇති ස්ථාන හා ඓතිහාසික වටිනාකමකින් යුත් ශාක රුක ගැනීම සම්බන්ධයෙන් අපට කළ හැකි දේ මොනවාද?**

**01**. කුණු කසල දමා අපිරිසිදු නොකිරීම.
**02**. ආරක්ෂිත වැටවල් යෙදීම.
**03**. උපදේශාත්මක පුවරු ප්‍රදර්ශනය කිරීම.
**04**. අතගා බැලමෙන් වැළකීම.
**05**. මේවායේ වටිනාකම පිළිබඳ අන් අය දැනුවත් කිරීම.
**06**. රජයෙන් ලබා දෙන උපදෙස් පිළිපැදීම.

**07**. ....................................................................................................................

**08**. ....................................................................................................................

**09**. ....................................................................................................................

**10**. ....................................................................................................................

**03) ඔබ ඉගෙන ගත් මෙවැනි ඓතිහාසික වැදගත්කමක් ඇති වෙනත් ස්ථාන හා ඓතිහාසික වටිනාකමකින් යුත් ශාක ලියන්න.**

**01.** ලංකාවේ මුල් ම තේ ගස.(ලූල්කඳුර වතුයාය)
**02.** දෙනිපිටියේ තුග රුක (ගජමන් නෝනාගේ කවි).
**03.** නාමල් උයන හා රෝස තිරුවානා කන්ද.

**04.** ......................................................................................................................................

**05.** ......................................................................................................................................

**06.** ......................................................................................................................................

**07.** ......................................................................................................................................

**08.** ......................................................................................................................................

**04) රටේ කීර්ති නාමය නැංවීමට දායකත්වය දැක්වූ චරිත කිහිපයක් පහත දැක්වේ. ඔවුන් හඳුනා ගෙන ඔවුන්ගේ තොරතුරු ඇසුරෙන් හිස්තැන් සම්පූර්ණ කරන්න.**

**01.**




- ආචාර්ය .................................................................... මහතා වර්ෂ **1877 අගෝස්තු 22 වැනි දින** කොළඹ කොල්ලුපිටියේ දී උපත ලැබීය.
- ඔහු විසින් රචිත ශාස්ත්‍රීය ග්‍රන්ථ හා නිබන්ධ ප්‍රමාණාත්මක ව මෙන් ම ගුණාත්මක බවින් ද අතිමහත් ය. එම සංඛ්‍යාව 500ට වඩා වැඩි ය. මෙතුමා **ඉංග්‍රීසි, ප්‍රංශ, ජර්මන්, ලතින්, ග්‍රීක්, සංස්කෘත, පාලි** යන භාෂාවල විශිෂ්ටත්වයට පැමිණියෙකි. නීතිවේදියකු හා පරිවර්තකයෙක් විය. බෞද්ධ ධර්ම ග්‍රන්ථ පාලි බසින් ඉංග්‍රීසියටත්, හින්දු ධර්ම ග්‍රන්ථ දෙමළ බසින් ඉංග්‍රීසියටත් පරිවර්තනය කරන ලදී.
- ලන්ඩනයේ ............................................ විද්‍යාලයය ඔහුගේ ගුරු ගෙදර විය.
- ඔහුගේ ප්‍රථම ශාස්ත්‍රීය ලේඛනය ........................................................... වාරික සංග්‍රහය යි. වර්ෂ 1905 දී "**ලංකා සමාජ ප්‍රතිසංස්කරණ සංගමය**" ඇරඹූ කුමාරස්වාමි "**සිලෝන් නැෂනල් රිවීව්**" **(ceylon national review)** සඟරාවේ සමාරම්භක සංස්කාරකවරයා විය.
- ආනන්ද කුමාරස්වාමි වූ කලි ලංකාවෙන් ලොවට දායාද කළ ප්‍රමුඛ පෙළේ දාර්ශනිකයෙකි. පෙරදිග කලා සම්පත් සංරක්ෂණය කිරීම භාර ව සිටි මොහුගේ අත් පිටපත් ලිපි ලේඛන ආදිය **බොස්ටන් ලලිත කලා කෞතුකාගාරයෙහි** අදත් සංරක්ෂණය කර තිබේ.
- "......................................................", "**ජාතික අපේක්ෂණ**", "**ඉන්දියානු ඉන්දුනීසියානු කලාවේ ඉතිහාසය**" මොහු විසින් රචිත කෘති ය. ඔහු වර්ෂ **1947 සැප්තැම්බර් 09** දින ඇමරිකාවේ බොස්ටන් නුවර දී මිය ගියේ ය.

**02.**



- වර්ෂ **1890 ජනවාරි 01 වැනි දා** උපත ලැබූ ආචාර්ය .......................... මහතාගේ ළමා කාලය ගැමි දරුවන් අතර ගෙවුණු සරල දිවි පෙවෙතක් විය. ඔහු **කොටහේන සාන්ත පාවුළු විදුහලෙන් ද, කොළඹ ශාන්ත තෝමස් විදුහලෙන් ද** අධ්‍යාපනය ලැබුවේ ය.
- වර්ෂ 1910 ජනවාරි මස **මහනුවර ධර්මරාජ විදුහලේ ගුරුවරයකු** ලෙස වැඩ භාර ගත් මෙතුමා **ලතින්, ග්‍රීක්, ආර්ථික විද්‍යාව, ඉතිහාසය** වැනි විෂයයන් මගින් ශිෂ්‍යයන් තුළ දේශාභිමානය, එඩිතර බව හා පෞරුෂත්වය ගොඩනැගෙන පරිදි ඉගැන්වීම් කටයුතුවල යෙදිණි.
- වර්ෂ 1917 දී **කොළඹ** ........................ **විද්‍යාලයයේ ගුරුවරයකු** ලෙස වැඩ කරන කාලයේ රට භාර ගැනීමට ඉවහල් වන අන්දමේ පූර්ණ අධ්‍යාපනයක් ශිෂ්‍යයන්ට ලබා දුන්නේ ය.
- වර්ෂ 1921 දී කොළඹ මරදාන ...................... විද්‍යාලයයේ විදුහල්පති විය. එකල තිබූ **කොළඹ කයිරියා බාලිකා පාසල සහ ඩෙන්හැම් ඉංග්‍රීසි පාසල** ආරම්භ කරන ලද්දේ මෙතුමා විසිනි.
- **අලුත්ගම, ගම්පොළ, මාතලේ සහ පුත්තලම** නගරවල සහිරා විද්‍යාලයයන් ද, **අලුත්ගම, අඩ්ඩාලච්චේන** නගරවල ගුරු විදුහල් ද ආරම්භ කළේ ය. ජාතික ........................... හා ජාතික ................ සම්පාදන කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකයකු වූ මෙතුමා වර්ෂ **1960 දී** සවුදි අරාබියාවේ දීනා නගරයේ දී මෙලොවින් සමු ගත්තේ ය.

03\.



- ආචාර්ය ක්‍රිස්ටෝපර් විලියම් විජේකෝන් .................................... මහතා ශ්‍රේෂ්ඨ අධ්‍යාපනඥයකු මෙන්ම ජාතික වීරයෙක් ද වේ. මෙතුමා වර්ෂ **1894 ඔක්තෝබර් මස 18** දින උපත ලැබීය. .
- එතුමා මහා භාරතයේ උපත ලැබී නම් ඔහු එහි දී දෙවියකු වශයෙන් පුද ලබනු ඇතැ යි වර්ෂ **1945** ලංකාවේ සිටි ඉන්දියානු නියෝජිත **එම්. එස්. අනේ** පවසා ඇත. **අම්බලන්ගොඩ වෙස්ලියන් සහ ගාල්ලේ රිච්මන්ඩ්** විදුහල්වල ඉගෙනුම ලැබූ ඔහු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට අයත් රටවල හොඳ ම ශිෂ්‍යයාට හිමි ත්‍යාගය ද දිනා ගත්තේ ය.
- රිච්මන්ඩ් විද්‍යාලයයේ ගුරුවරයකු ලෙස ගුරු වෘත්තියට පැමිණි ඔහු **මොරටුව වේල්ස් කුමර විද්‍යාලයය සහ කොළඹ වෙස්ලි විද්‍යාලයයේ ද** සේවය කළේය. වර්ෂ **1931** සිට ක්‍රි.ව. **1946** තෙක් කාලයේ ලංකාවේ ............................ ඇමති ව සිට කරන ලද සේවාව අතිමහත් ය.
- **පළමු වන ශ්‍රේණියේ සිට විශ්වවිද්‍යාලය තෙක් නිදහස් අධ්‍යාපනය නොමිලේ ලබා දීම, මවුබස අධ්‍යාපන මාධ්‍යය බවට පත් කරීම, පාසල් රජයට පවරා ගැනීම, මධ්‍ය මහා විද්‍යාලය ආරම්භ කරීම, සැම ළමයකුට ම තම දෙමවුපියන්ගේ ආගම ඉගැන්වීම, ආදායම් අඩු ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව ලබා දීම, පොදු විෂය නිර්දේශයක් සකස් කිරීම, විෂය බාහිර කටයුතු සංවිධානය, පාසල්වලට ක්‍රීඩා පිටිටනි ලබා දීම, සංගීතය, නැටුම්, මලල ක්‍රීඩා ඉගෙනීමට අවස්ථා ලබා දීම, දෙවන පන්තියේ සිට ඉංග්‍රීසි විෂයය ලෙස ඉගෙනීමට අනිවාර්ය කිරීම** වැදගත් විය.
- මෙම නවීකරණ ඔස්සේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ නව නැම්මක් ඇති වූ අතර ඒ වකවානුව වන විට ......................... **අතින් ආසියාවේ දියුණු ම රට බවට** ශ්‍රී ලංකාව පත් විය. පරාදීන යුගයක වුව ද ශ්‍රී ලංකාවේ අධ්‍යාපන රටාව වෙනස් කිරීමේ කාර්යයට උරදීමෙන් මෙම ශ්‍රේෂ්ඨ අධ්‍යාපනඥයා ජාතික වීරයකු වශයෙන් ද සැලකෙන අතර ශ්‍රී ලාංකිකයන්ගේ ............................................. යනුවෙන් විරුදාවලිය ලැබී ය.

04\.



- වර්ෂ **1901 දී** ඉන්දියාවේ **ටිබෙට් රටේ සීකීම් ප්‍රදේශයෙහි** උපත ලද ......................................................... දරුවා වයස අවුරුදු **12** දී කොළඹ **විද්‍යෝදය පිරිවෙනට** ඇතුළත්ව පාලි, සිංහල, සංස්කෘත ඉගෙන ගත්තේ ය. **මහාබෝධි විද්‍යාලයයෙන්** ඉංග්‍රීසි ද **පොල්ගස්දූව ආරාමයෙන්** ප්‍රාචීන භාෂා ද හැදෑරී ය.
- රත්ගම සිරිවුලසුමන හිමියන්ගේ ශිෂ්‍යයකු ලෙස දොඩනදූවේ ශෛලබිම්බාරාමයේ දී ................................................ නමින් පැවිද්ද ලබා ගත්තේ ය.
- ඒ හිමිපාණෝ **වර්ෂ 1934-1936** කාලය තුළ කොළඹ ...................... විද්‍යාලයයේ **සිංහල, පාලි, බුද්ධ ධර්මය** ඉගැන්වූහ. පන්සල සහ ගම වෙනුවෙන් විශාල සේවාවක් කළ උන් වහන්සේ විසින් **නව ලංකා දහම් පාසල** හා **ඉංග්‍රීසි පාඨශාලාව** ආරම්භ කරන ලදි. එමෙන් ම සතර පේරුවේ ගම්වලින් බෙහෙත් එකතු කොට නොමිලේ බෙහෙත් දෙන ............... බෙහෙත් ශාලාවක් පිහිටුවූ උන්වහන්සේ .............. මස් කැමෙන් ගම්මුන් වළකාලීමට තදින් ම ක්‍රියා කළ අතර පානදුරේ තොටගමුවේ උපසම්පදා භික්ෂු මණ්ඩලයේ **ලේකම් තනතුර** ද දැරූහ.
- කොළඹ යුගයේ ජනප්‍රිය කවියකු වූ මෙතුමන් ගද්‍ය, පද්‍ය **කෘති 40ක් පමණ** රචනා කර ඇත. **ලංකා මාතා, නිදහසේ මන්ත්‍රය, නිදහසේ දැහැන, දරු නැළවිල්ල** ආදි ග්‍රන්ථ ශ්‍රී ලාංකිකයන්ගේ දේශාභිමානය හැඟීම් ජනිත කරවීමට සමත් විය. උන්වහන්සේගේ මුල් ම කෘතිය වශයෙන් .......................... ද අවසාන කෘතිය වශයෙන් .......................... ද සැලකේ.
- දේශාභිමානී හැඟීමෙන් කටයුතු කොට ජාතික මෙහෙවරක යෙදුණු මෙතුමාණෝ වර්ෂ **1951 මාර්තු මස 14 දින** අපවත් වූහ.



05\.



- දකුණු එංගලන්තයේ සමර්සෙට් ප්‍රදේශයේ මයින්හෙඩ් යන නගරයේ දී වර්ෂ **1917 දෙසැම්බර් මස 16 වන දා** ශ්‍රීමත් .......................................... මහතා උපත ලැබීය.
- මොහු **විද්‍යාඥයකු** මෙන් ම ප්‍රසිද්ධ .......................... . මොහු ප්‍රසිද්ධියට පත් වූයේ වර්ෂ **1945 දී වයර්ලස් වර්ල්ඩ්** යන සඟරාවේ පළ කරන ලද ලිපියකිනි. පොළොවේ සිට අහසට චන්ද්‍රිකා යැවිය හැකි ය යනුවෙන් ද එම චන්ද්‍රිකා උපයෝගි කරගෙන පණිවිඩ හුවමාරු ක්‍රමයක් නිර්මාණය

කළ හැකි බව ද මොහු ප්‍රකාශ කර ඇත.

- මෙතුමා වර්ෂ **1956 දී** ශ්‍රී ලංකාවේ පදිංචියට පැමිණි අතර **මොරටුව විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා** මෙන් ම එංගලන්තයේ **රාජකීය තාරකා විද්‍යාඥයන්ගේ සංගමයේ සාමාජිකයකු** ලෙස ද කටයුතු කළේ ය.
- මෙතුමාට උපාධි හා සම්මාන 38ක් පමණ පිරිනමා ඇත. ..................... පදවියෙන් ද පිදුම් ලැබූ ඒ මහතා අනූ වියැති ව සිටිය දී වර්ෂ **2008 මාර්තු 19 දා** ශ්‍රී ලංකාවේ දී මිය ගියේ ය.

**06**........................ **07**........................ **08**...................... **09**...................... **10**..........................

............................ ............................ .......................... .......................... ..............................

**11**........................ **12**........................ **13**...................... **14**...................... **15**..........................

............................ ............................ .......................... .......................... ..............................

**05)** **ඉහත පුද්ගලයන් හැරුණු විට ඔබ දන්නා රටේ කීර්ති නාමය නැංවීමට දායකත්වය දැක්වූ විවිධ ක්ෂේත්‍රවලට අයත් වෙනත් චරිත කිහිපයක් (ජාතික වීරයන්) නම් කරන්න.**

**01.** ....................................................................................................................................

**02.** ....................................................................................................................................

**03.** ....................................................................................................................................

**04.** ....................................................................................................................................

**05.** ....................................................................................................................................

**06.** ....................................................................................................................................

**07.** ....................................................................................................................................

**08.** ....................................................................................................................................

**09.** ....................................................................................................................................

**10.** ....................................................................................................................................


**11.** ....................................................................................................................................

**12.** ....................................................................................................................................

**06) පහත දැක්වෙන අතීත කලා නිර්මාණයන් හඳුනාගෙන නම් කරන්න.**



.........................................................................................



.........................................................................................

**07) ලියවැල්/පලාපෙති කිහිපයක් චිත්‍රයට නඟන්න. අඳින ලද චිත්‍ර අලංකාර ව වර්ණ ගන්වන්න. අලංකාර ව වර්ණ ගන්වන ලද ලියවැල් කතුරක ආධාරයෙන් කැටයමක් ලෙස සියුම් ව කපන්න. ඉන් පසු කළු පැහැති කොළයක අලවා ප්‍රදර්ශනය කරන්න.**

**08) අතීතයේ සිට පැවත එන ජනප්‍රිය ක්‍රීඩාවක් වන "ඔලිඳ කෙළිය" වර්තමානයේ අප අතරින් ගිලිහී යන ක්‍රීඩාවකි. පහත සඳහන් වන්නේ එම ක්‍රීඩාව සිදු කරන ආකාරයයි. සුදුසු වචන යොදා එහි හිස්තැන් සම්පූර්ණ කරන්න.**

- ඔලිඳ කෙළිය ක්‍රීඩාව කරනු ලබන්නේ සිදුරු කිහිපයකින් යුත් ...................................... මත යි.
- මෙය ඔලිඳ ................................ හෝ ඔලිඳ ................................ හෝ යනුවෙන් හඳුන්වයි.
- මෙම ක්‍රීඩාවේ නීති ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් විය ........................ ය.
- මේ සඳහා ක්‍රීඩකයෝ ..................................... අවශ්‍ය වෙති.
- ඔවුහු පුවරුව ..................................... අසුන් ගනිති.
- පුවරුවේ එක් පසෙක සිදුරු ......... ක් ඇත. එක් සිදුරක ඔලිඳ ඇට .......... ක් බැගින් ඇත.
- ක්‍රීඩකයන් පුවරුවේ තමන්ට අදාළ සිදුරුවල ඇති ඔලිඳ ඇට එක් සිදුරක සිට අනෙක් සිදුරට මාරු කළ යුතු අතර, මෙසේ මාරු කරන විට ................ වන සිදුරට .............................. ඇති සිදුරේ ඇති ඔලිඳ ඇට එකතු කර ගත යුතු ය.
- අනතුරු ව එම සියලු ඇට තමාට හිමි ............................. දමනු ඇත.
- මෙසේ ............. ප්‍රමාණයක් ඔලිඳ ඇට එකතු කර ගන්නා ක්‍රීඩකයා ජයග්‍රහණය කරයි.

**09) අතීත මුතුන්මිත්තන්ගේ සේවය සැමට ම ආදර්ශවත් ය. අතීතයේ දී අතීත මුතුන්මිත්තන්ගේ නිරන්තරයෙන් දක්නට ලැබුණ උතුම් ගුණාංග තමානවාදැයි ලියන්න.**

1. වැඩිහිටියන්ට ගරු කිරීම.
2. ..........................................................................................................................
3. ..........................................................................................................................
4. ..........................................................................................................................
5. ..........................................................................................................................
6. ..........................................................................................................................

**10) මෙරට සාම්ප්‍රදායික කලා ශිල්ප දෙස බලන විට අතීතයේ සිට පැමිණි දැනුම වර්තමානයේ පවා යොදා ගනු පෙනේ. ඔබ දන්නා එවැනි සාම්ප්‍රදායික කලා ශිල්ප කිහිපයක් නම් කරන්න.**

1. ............................................................ 2. ............................................................
3. ............................................................ 4. ............................................................
5. ............................................................ 6. ............................................................

# 16 තේමාව - පිළිතුරු පත්‍රය.

01) 01. සීගිරිය. 02. සීගිරි සිතුවම් (ළඳුන්). 03. ගාලු කොටුව.
04. යාපනය කොටුව. 05. නිශ්ශංකලතා මණ්ඩපය 06. දඹුලු ලෙන් විහාරය.
07. පරාක්‍රමබාහු රජමාළිගය. 08. තිවංක පිළිමගෙය. 09. ඇම්බැක්කේ ලී කැටයම්.
10. කුට්ටම් පොකුණ. 11. සඳකඩ පහණ. 12. ථූපාරාමය.
13. දළදා මාළිගාව. 14. රුවන්වැලි මහා සෑය. 15. සමාධි ප්‍රතිමාව.
16. ගල් විහාරය. 17. ඉසුරුමුණි පෙම් යුවල. 18. බෙහෙත් ඔරු.
19. මුරගල. 20. මැදිරිගිරිය වටදාගෙය. 21. සෙල් ලිපි (මිහින්තලේ).
22. අවුකන පිළිමය. 23. නෙළුම් පොකුණ. 24. ශ්‍රී මහා බෝධිය.
25. මඟුල් මඩුව (මහනුවර). 26. රිටිගල (පෙත්මග). 27. පැරණි ගල් පාලම (අනුරාධපුරය).
28. පරාක්‍රම බාහු ප්‍රතිමාව.

02) 07. මතක සටහන් ලිවීමෙන් වැළකීම.
08. කුරුටු නොගෑම.
09. සංරක්ෂණ උපදෙස් පිළිපැදීම.
10. අවට ගස්කොළන් කඩා බිඳ දැමීමෙන් වැළකීම. ........ආදිය

03) 04. ලංකාවේ මුල් ම රබර් ගස. - පේරාදෙණිය හා හෙනරත්ගොඩ උද්‍යානය.
05. මන්නාරමේ බඹබැබ් ගස (Baobab).
06. කැබලිත්තැවේ සියඹලා ගහ.
07. කැප්ටන් ඩෝසන් කුලුන.
08. රන්මසු උයන.
09. ඔපනායක යෝධ පුස්වැල, අම්බලම. ........ආදිය

04) 01. ආනන්ද කුමාරස්වාමි, වයික් ලිප්, ලංකාවේ කඳු හා මිනිරන්, මධ්‍යකාලීන සිංහල කලා.
02. ටී. බී. ජයා, ආනන්ද, සහිරා, කොඩිය, ගීය.
03. කන්නන්ගර, අධ්‍යාපන, අධ්‍යාපනය, අධ්‍යාපනයේ පියා.
04. එස්. කේ. තෂිනම්ගල්, සීකිම් මහින්ද, විද්‍යෝදය, පින්, ගව, ඔවා මුතුදම, ශ්‍රී පාදය.
05. ආතර් සී. ක්ලාක්, ලේඛකයෙකි, නයිට්.
06. අනගාරික ධර්මපාල තුමා.
07. ඕල්කට් තුමා.
08. පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේව.
09. ඇම්. සී. සිද්දිලෙබ්බේ මහතා.
10. පොන්නම්බලම් රාමනාදන් මහතා (පොන්න-
-ම්බලම් අරුනාචලම් මහතාගේ සහෝදරයෙකි).
11. ආරුමුග නාවලර් තුමා.
12. පූජ්‍ය මීගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි.
13. පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි.
14. මාර්ටින් වික්‍රමසිංහ මහතා.
15. කුමාරතුංග මිනිදාස මහතා.

05) 01. ඩී. එස්. සේනානායක මහතා.
02. ආතර් වී දියෙස් මහතා (කොස් මාමා).
03. පොන්නම්බලම් අරුණාචලම් මහතා.
04. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය.
05. එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා.
06. මහා විජයබාහු රජතුමා.
07. නිශ්ශංකමල්ල රජතුමා.
08. දුටුගැමුණු රජතුමා.
09. මහා පරාක්‍රමබාහු රජතුමා.
10. ආනන්ද සමරකෝන් මහතා.
11. ගුණදාස අමරසේකර මහතා.
12. සාගර පලන්සූරිය මහතා. ........ආදීන්

06) 01. ලියවැල් සටහන්.
02. පලාපෙති මෝස්තර.

07) -

08) 01. ලී පුවරුවක්.
02. කොලොම්බුව, පෝරුව.
03. හැකි.
04. දෙදෙනෙක්.
05. දෙපස.
06. 7, 4.
07. හිස්, ඉදිරියෙන්.
08. කොටුවට.
09. වැඩි.

09) 01. නොපැකිල ව උදවු උපකාර කිරීමට පෙලඹීම.
02. අවවාද අනුශාසනා නිසි ලෙස පිළිපැදීම.
03. ගුණගරුක බව රැකගෙන ක්‍රියා කිරීම.
04. එකට එක නොකීම.
05. එකමුතු ව කටයුතු කිරීම. ...........ආදිය

10) 01. වෙස් මුහුණු හා රුකඩ කලාව.
(අම්බලංගොඩ හා උඩුපිල ).
02. ලාක්ෂා චිත්‍ර කලාව (කන්ද උඩරට).
03. පිත්තල කැටයම් කලාව.
04. බිතු සිතුවම් කලාව.
05. කැටයම් කලාව.
06. පැදුරු විවීම. ........ආදිය